විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු
චක්‍රලේඛ අංක: 01/97

මගේ අංකය: පී.එන්.4042 ඊ
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
කොළඹ - 10.
1997.02.05 වැනි දින.

සියළුම දිස්ත්‍රික් ලේකම්වරු,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරු,
පළාත් පාලන විශ්‍රාම වැටුප් අංශය.

1997 ජනවාරි මාසයේ සිට විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප්
වැඩි කිරීම

1996.12.31 දින හෝ ඊට පෙර විශ්‍රාම ලැබූවන්ගේ විශ්‍රාම වැටුප 1997 ජනවාරි මාසයේ සිට 10% කින් වැඩි කිරීමට රජය තීරණය කර ඇත.

02. ඒ අනුව දැනට විශ්‍රාමිකයන්ට ගෙවනු ලබන සියළුම දීමනා සමග ඔවුන් ලබන දළ විශ්‍රාම වැටුප 10% කින් වැඩි කළයුතු අතර, එම වැඩිවීමෙන් අර්ධයක් 1997 ජනවාරි මාසයේ සිට ගෙවිය යුතුය. 1998.01.01 දින සිට ඉතිරි අර්ධය සමග මුළු වැඩිවීම් ප්‍රමාණයම ගෙවීමට කටයුතු කළයුතුය.

| | | | |
|---|---|---|---|
| උදා: | 1996.12.31 දිනට මාසික විශ්‍රාම වැටුප | = | රු: 3000.00 |
| | ලබමින් සිටි විශේෂ දීමනාව හා ජීවන වියදම් දීමනාව | = | රු: 860.00 |
| | | = | රු: 3860.00 |
| | ලැබූ දළ විශ්‍රාම වැටුප | = | $3860 \times \frac{10}{100}$ |
| | 10% වැඩි වීම | | |
| | | = | රු: 386.00 |
| | වැඩිවන මුදල | | |
| | ඉන් අර්ධය | = | $\frac{386}{2}$ = රු: 193.00 |
| | 1997.01.01 දින සිට ගෙවිය යුතු විශ්‍රාම වැටුප | = | 3860 + 193 |
| | | = | රු: 4053.00 |
| | 1998.01.01 දින සිට ගෙවිය යුතු විශ්‍රාම වැටුප | = | රු: 3860 + 386 |
| | | = | රු: 4246.00 |

03. - රුපියල් 600/= විශේෂ දීමනාව පමණක් ලබන විශ්‍රාමිකයන්ගේ එම දීමනාව වැටුපට එකතු කර දළ විශ්‍රාම වැටුප ගෙන ඉන් 10% වැඩි කළයුතු වේ.

04. ඉහත ආකාරයට සෑම විශ්‍රාමිකයෙකුගේම හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලබන්නන්ගේ විශ්‍රාම වැටුප් වැඩි කර 1997 ජනවාරි මාසයේ සිට හිඟ මුදල්ද සමග 1997 මාර්තු මාසයේ දී ගෙවීම් කිරීමට කටයුතු කරනමෙන් දන්වමි.

(පී. [illegible] ජයවර්ධන)
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ

පිටපත්:-

1. අයවැය අධ්‍යක්ෂ.
2. විගණකාධිපති.
3. ලේකම් - රා.පරි.ස්ව.ශා.වැ.ක. හා පා.ර්.ක. අමාත්‍යාංශය.

බෝප/-

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු
චක්‍රලේඛ අංක: 16/94

~~මගේ අංකය:~~ විවැ/4032/ඊ
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
අංක: 54, චැතම් වීදිය,
කොළඹ - 01.
1994 අගෝස්තු 05 දින.

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පලාත් පාලන විශ්‍රාම වැටුප් ඒකකය,
සහ දුම්රිය සාමාන්‍යාධිකාරී.

## විශ්‍රාම වැටුප් විෂමතා කමිටුවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම.

1992.11.18 වන දිනට පෙර විශ්‍රාම ගිය සියලුම රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් විෂමතා කමිටුවේ නිර්දේශයන් මත 1994.05.01 දින සිට සංශෝධනය කළ යුතුයැයි රජය විසින් තීරණය කොට ඇත. මෙම සංශෝධනය සියලුම සිවිල්, ගුරු, හමුදා, පලාත් පාලන සහ වැන්දඹු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වෙනුවෙන් අදාළ වේ. සංශෝධනයට අදාල සූත්‍රය අමුණා ඇති වගුවෙහි ('අ' ඇමුණුම) දැක්වේ.

02. 1992.12.24 දින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 37/92 අනුව ගෙවන ලද රු:300/=ක මාසික දීමනාව සහ 1993.12.13 වන දින මගේ අංක:24/93 දරණ චක්‍රලේඛය මගින් ගෙවන ලද වැඩිවීමද 1994.05.01 දින සිට ඉවත් කළයුතුය.

03. අනුමත කරන ලද වැඩිවීම ගණන් බැලිය යුත්තේ අඩු නොකළ විශ්‍රාම වැටුප මතය. 1994.07.26 දින අංක 14/94 දරණ මගේ චක්‍රලේඛය මගින් දුන් උපදෙස් අනුව උපුටා ගත් දත්තයන් මෙම වැඩිවීම් ගණන් බැලීම සඳහා උපයෝගී කර ගත හැක. 1987.11.17 දිනට පෙර විශ්‍රාම ගිය අයගේ අඩු නොකළ විශ්‍රාම වැටුප වනුයේ 1988 චක්‍රය අනුව එදිනට පරිවර්තනය කළ විශ්‍රාම වැටුපය.

04. <u>අවම වැඩිවීම</u>:- 01 වන ඡේදයෙහි දක්වා ඇති පරිදි ගණනය කළ වැඩිවීමෙන් 02 වන ඡේදයෙහි සඳහන් දීමනා අඩුකළ විට ශුද්ධ වැඩිවීම රු:200/= ට අඩු වන්නේ නම් දැනට ගෙවනු ලබන දල විශ්‍රාම වැටුපට වඩා රු:200/= කින් වැඩිවනසේ සංශෝධනය ගැලපිය යුතුය. දැනට ගෙවනු ලබන මූලික විශ්‍රාම වැටුපේ සහ වැඩිවීමේ එකතුව නව සංශෝධිත මූලික විශ්‍රාම වැටුප වශයෙන් සැලකිය යුතුය.

05. 1994 අගෝස්තු මස විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වූ කාර්යයන් දැනටමත් නිම කොට ඇත්නම් මෙම සංශෝධනයට අදාල 1994.05.01 දින සිට 1994.08.31 දක්වා වූ හිඟ මුදල් වහාම ගෙවිය යුතුය. හිඟ මුදල් ගෙවීමේදී 1994.05.01 දින සිට ගෙවන ලද ඉහත 02 වන ඡේදයේ සඳහන් දීමනා පැහැදිලිවම සැලකිල්ලට ගත යුතු බැව් කරුණාවෙන් සලකන්න.

06. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වන අමතර අත් මුදල් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් කෙලින්ම ලබාගත යුතුය.

මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබනුයේ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

(ආර්.ඩබ්ලිව්.පියසේන)
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ

පිටපත:- භා.නි.ලේ.
රා/-

''අ'' ඇමුණුම

වගුව

මූලික විශ්‍රාම වැටුප් සඳහා වැඩිවීම් (අඩු නොකළ) පහත දක්වා ඇති පරිදි අවමයකට යටත්ව වැඩිවීමේ ප්‍රතිශතකය.

| | රු: 500 ක අවම වැඩිවීම හෝ දක්වා ඇති ප්‍රතිශතකය | | රු: 400 ක අවම වැඩිවීම හෝ දක්වා ඇති ප්‍රතිශතකය | | |
|---|---|---|---|---|---|
| | 1982.01.02 දිනට පෙර විශ්‍රාම ගිය | 1982.01.02 දින සිට 1984.12.31 දින දක්වා | 1985.01.01 දින සිට 87.11.16 දින දක්වා | 1987.11.17 දින සිට 90.10.17 දින දක්වා | 1990.10. දින සිට 92.12.17 දින දක්වා |
| සිවිල් විශ්‍රාමිකයින් | 1 හා 2 ලක්ෂ කාණ්ඩ | 3 ලක්ෂ කාණ්ඩ | 4 ලක්ෂ කාණ්ඩ | 5 ලක්ෂ කාණ්ඩ | 6 [illegible] කාණ්ඩ |
| හමුදා විශ්‍රාමිකයින් | අංක: 1 - 8999 | 9000 - 12999 | 13000 - 16999 | 17000 - ඉදිරියට | - |
| ගුරු විශ්‍රාමිකයින් | අංක 1 - 13999 | 14000 - 15999 | 16000 - 17999 | 18000 කාණ්ඩ | 6 ලක්ෂ කාණ්ඩ |
| වැ.අ.වි.වැ. විශ්‍රාමිකාවන් | 1-199999 | 2 ලක්ෂ කාණ්ඩ | 3 ලක්ෂ කාණ්ඩ | 4 ලක්ෂ කාණ්ඩ | 5 ලක්ෂ කාණ්ඩ |
| මාසික මූලික වැටුපේ ප්‍රමාණය (අඩු නොකළ) රුපියල් | | | | | |
| 1500 ට අඩු | 45% | 40% | 35% | 20% | 15% |
| 1501-2000 | 50% | 45% | 38% | 20% | 15% |
| 2001-2500 | 55% | 48% | 40% | 20% | 15% |
| 2501-3000 | 60% | 51% | 42% | 20% | 15% |
| 3001-3500 | 65% | 54% | 44% | 20% | 15% |
| 3501-4000 | 70% | 57% | 46% | 20% | 15% |
| 4001-හෝ ඊට වැඩි | 75% | 60% | 48% | 20% | 15% |